සියලු ම හිමිකම් ඇවිරිණි/
முழுப் பதிப்புரிமையுடையது/
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

**NEW**

## 2562 - මූලික පිරිවෙන් අවසාන විභාගය - 2018 දෙසැම්බර්
(නව නිර්දේශය)

**01 S I**

පැ තුනයි

## (01) සිංහල - I පත්‍රය

2018.12.19 /08.30 - 11.40

අමතර කියවීම් කාලය -මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

### I කොටස

සැලකිය යුතුයි :

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු **40** ක් ලැබේ.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
* ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

---

- අංක **1** සිට **40** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

*(ලකුණු 01 × 40 = 40 යි)*

- අංක **1** සිට **3** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප පිළිතුර තෝරන්න.

1. **බීමත්කමට අබ්බැහි වූ** පුතා සිය මූණේ ඇලි ගෑ බව පියා පැවසී ය.
   (1) වෙස් වලා ගත් බව (2) කීර්තිය නැති කළ බව
   (3) ලජ්ජාවට පත් කළ බව (4) අවලස්සන කළ බව

2. **වැල්වටාරම්වලින්** කාලය නාස්ති වීමයි සිද්ධවෙන්නේ
   (1) අනවශ්‍ය විස්තරවලින් (2) වටේ එතුණු වැල්වලින්
   (3) විවේචනවලින් (4) තර්කවිතර්කවලින්

3. උත්සවය සඳහා **ඉස්පාසුවක්** නැතිව වැඩ කිරීම නිසා ඔහු හදිසියේ අසනීප විය.
   (1) ඉවසීමක් (2) නින්දක්
   (3) විවේකයක් (4) සහයෝගයක්

- අංක **4** සිට **6** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි හිස්තැන්වලට වඩාත් සුදුසු පිළිතුර තෝරන්න.

4. විභාගයට අනිවාර්ය විෂයයන් මෙන් ම .............................. විෂයයන් කිහිපයක් ද ඇතුළත් වේ.
   (1) වෛකල්පිත (2) වෛවාහික
   (3) වෛකල්පික (4) වෛවර්ණිත

5. සම්මාන ප්‍රදානය සඳහා .............................. පහක් යටතේ සුදුස්සෝ තෝරා ගනු ලබති.
   (1) නිර්මාපණ (2) නිර්ණායක
   (3) නිර්ධාරණ (4) නිර්නාමික

[ 2 වැනි පිටුව බලන්න.

6. විශ්වවිද්‍යාලයට තේරුණු රංගජීවට පැවති එක ම ............................. වූයේ දරිද්‍රතාවයි.
   (1) අභියෝගය (2) අභිලාෂය
   (3) අභිමානය (4) අභිෂේකය

7. අකාරාදි පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පේළිය තෝරන්න.
   (1) කෛරාටික, කෞශල්‍ය, භූෂණය, තාක්ෂණික
   (2) ජනශ්‍රැති, තදාශ්‍රිත, ප්‍රශස්ත, ලාවණ්‍ය
   (3) නෛතික, ධර්මිෂ්ඨ, ධුරන්ධර, කෘතඥ
   (4) ප්‍රාමාණික, මූලාශ්‍රය, ජලාශ්‍රිත, දුරවබෝධ

8. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
   (1) ප්‍රවෘත්ති, ලේඛම්, ලේඛණය, ප්‍රස්ථාර
   (2) මර්ධනය, ගවේෂණය, මධ්‍යසාර, වාර්ථාව
   (3) විශිෂ්ට, ආභාසය, සමස්ත, ශීඝ්‍රගාමී
   (4) ශිෂ්ඨාචාරය, ලේඛකාධිකාරී, කණිෂ්ඨ, ද්‍රාවනය

9. පහත දැක්වෙන පදවල මුල් අකුරෙහි පිළිවෙළින් ඇදය, දීර්ඝපාපිල්ල, ඉස්පිල්ල, ගැටඇලපිල්ල යෙදී ඇති වරණය තෝරන්න.
   (1) කැරැල්ල, පූර්වස්වරය, විභීෂණ, ගෘහය (2) දැහැන, දීර්ඝායුෂ, දෘෂ්ටිපථය, ශාස්ත්‍ර
   (3) ශ්‍රැතිය, නීවරණ, නිරායුධ, තෘණ (4) ධාරණාව, ධූමකේතු, නිර්ව්‍යාජ, නෘත්‍ය

10. පහත දැක්වෙන වචනවල අනුස්වාරය, විසර්ගය, යංශය, රකාරාංශය පිළිවෙළින් දැක්වෙන වරණය කුමක් ද?
   (1) වංශාධිපති, ප්‍රාථමික, නිරවද්‍ය, වයඃකල්‍යාණ
   (2) අධ්‍යයන, අන්තඃපුර, ග්‍රාහක, පාංශුකූලය
   (3) ආරණ්‍යය, තාපාංශකය, ප්‍රශස්ත, අන්තඃස්ථ
   (4) සංයුක්ත, මනඃකල්පිත, මහේශාඛ්‍ය, චක්‍රායුධය

11. පහත දැක්වෙන පදවල අවසාන අකුර කණ්ඨජ, තාලුජ, මූර්ධජ, දන්තජ වශයෙන් පිළිවෙළින් යෙදී ඇති වචන පේළිය කුමක් ද?
   (1) ඡන්ද, ව්‍යාජ, විශේෂ, කළාල (2) සංඝ, ප්‍රකාශ, කේරළ, අර්ථ
   (3) විහාර, පඤ්චම, ලලාට, වෛශාඛ (4) අතිරේක, ප්‍රමාණ, තෘතීය, යථාර්ථ

12. උක්ත ඒකවචන පද දෙකක් යෙදී ඇති පද පේළිය තෝරන්න.
   (1) ඕ, රෝගියෙකු, ශිෂ්‍යයෝ, භික්ෂූහු
   (2) පයෝෂීකයා, ගංගාවෝ, මිත්‍රයකු, ප්‍රවීණයන්
   (3) හෙතෙම, උපාසිකාවෝ, විද්‍යාඥයෙක්, ඇතැමුන්
   (4) විද්වත්හු, දිළින්දෙකු, වැද්දෙක්, තාරකාවන්

13. තද්ධිත නාමයක් ඇතුළත් නො වන වාක්‍යය තෝරන්න.
   (1) කෞතුකාගාරයේ දකුණු පසින් මධ්‍යකාලීන යුගයට අයත් පුරාවස්තු ඇත.
   (2) සමිතියේ ඒකමතික තීරණය වූයේ සභාපති ඉවත් කළ යුතු බවයි.
   (3) වැටුපට අමතරව ලිපිකරුවා අතිකාල දීමනා ද ලබයි.
   (4) මෙරට ආර්ථික ක්‍රමය සකස් වී ඇත්තේ කෘෂිකර්මය පදනම් කරගෙන ය.

[ 3 වැනි පිටුව බලන්න.

● අංක **14** සිට **16** තෙක් ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.

14. දස **එකඩමසක්** කුස දරා සිටි දරුවා දැකීම හැර මවකට තවත් සතුටක් කොයින් ද?
   (1) මාස දහය හමාරක්   (2) එකක් අඩු මාස දහයක්
   (3) මාස නවය හමාරක්   (4) දහයක් හා එක් අඩමසක්

15. උන් වහන්සේ **දෘෂ්ටාන්ත කොට** දක්වන කරුණු මට පැහැදිලි ය.
   (1) විස්තර කොට   (2) උදාහරණ කොට
   (3) අවධාරණය කොට   (4) දෘෂ්ටිගත කොට

16. පිය රජතුමා දූ කුමරියගේ **පාණිග්‍රහණය** සඳහා අවශ්‍ය සියලු කටයුතු සම්පාදනය කරවී ය.
   (1) ප්‍රාණාරක්ෂාව   (2) සරණමංගල්‍යය
   (3) ආශාව සංසිඳුවීම   (4) පණ ගැළවීම

17. පහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   (1) හලන්ත නාමවලට පරව 'මත්' තද්ධිත ප්‍රත්‍යය යෙදේ.
   (2) විධානාඛ්‍යාතය කාල භේදය අනුව වරනැගේ.
   (3) ශුද්ධ ආඛ්‍යාත (ආඛ්‍යාත ක්‍රියා) ලිංග අනුව වරනැගේ.
   (4) යංශයට මුලින් යෙදෙන ව්‍යංජනාක්ෂරය හල් අකුරක් ලෙස උච්චාරණය කෙරේ.

18. මුලින් දී ඇති සමාස වර්ගයට අයත් පද පමණක් ඇතුළත් පද පෙළිය තෝරන්න.
   (1) අන්‍යාර්ථ සමාසය - ගොපලු, තිනෙත්, ශිෂ්‍යාධාර, මින්දද
   (2) විභක්ති සමාසය - කිරිබත්, උපැස්, මුහුදුසුළං, මිණිමුතු
   (3) විශේෂණ සමාසය - වල්අඹ, පන්සිල්, සඳවත, නරසී
   (4) අව්‍යය සමාසය - පරවැඩ, උපමාන, අසුර, තුන්ලොව

19. මුලින් දැක්වෙන සන්ධිපදවලට අනුරූප නොවන සන්ධි පදයක් ඇතුළත් පද පෙළිය තෝරන්න.
   (1) පරස්වර ලෝප සන්ධිය - සුරත, මුනිඳු, රටල, ගුරුතුමා
   (2) පූර්වරූප සන්ධිය - ගෙත්තම්, විස්සම්, පෙස්සම්, කම්මල
   (3) ස්වරාදේශ සන්ධිය - වටොර, ග්‍රාමෝදය, දැවර, චූලෝදර
   (4) ද්විත්ව රූප සන්ධිය - කොල්ලා, කුල්ලෙන්, ඉන්නල, සියල්ල

20. පහත දැක්වෙන වාක්‍යයේ තද කළු අකුරින් මුද්‍රිත පදවල විභක්ති රූප අනුපිළිවෙළට යෙදී ඇති පද පෙළිය තෝරන්න.
**ක්‍රීඩා සමාජවලට** ලබා දී තිබූ **ක්‍රීඩා භාණ්ඩයන්හි** ප්‍රමිතිය පිළිබඳ **ක්‍රීඩා උපදේශකයන් විසින්** පැමිණිලි ඉදිරිපත් කරන ලදී.
   (1) සම්ප්‍රදාන විභක්ති, ආධාර විභක්ති, ප්‍රථමා විභක්ති, කර්තෘ විභක්ති
   (2) ප්‍රථමා විභක්ති, කර්තෘ විභක්ති, ආධාර විභක්ති, සම්ප්‍රදාන විභක්ති
   (3) ආධාර විභක්ති, ප්‍රථමා විභක්ති, සම්ප්‍රදාන විභක්ති, කර්තෘ විභක්ති
   (4) සම්ප්‍රදාන විභක්ති, ආධාර විභක්ති, කර්තෘ විභක්ති, ප්‍රථමා විභක්ති

21. නිපාත පද තුනක් ඇතුළත් වාක්‍යය තෝරන්න.
   (1) ලේකම් මහතා විසින් සභාවට ඉදිරිපත් කරන ලද වාර්තාව සත්‍ය වාර්තාවක් ලෙස සභා සම්මත විය.
   (2) තරුණයන් ක්‍රීඩාවට යොමු කෙරේ නම් ඔවුන් මත්ද්‍රව්‍ය උවදුරින් මුදවා ගත හැකි ය.
   (3) සිංහල සාහිත්‍යයේ කෝට්ටේ යුගයට අයත් වන හංස සන්දේශය වීදාගම මෛත්‍රෙය හිමියන්ගේ ම කෘතියකි.
   (4) රියදුරෝ විනය ගරුක වෙත් නම් මාර්ග අනතුරු වළක්වා ගත හැකි වේ.

[ 4 වැනි පිටුව බලන්න.

22. නාම ප්‍රකෘතිවලට හා ධාතු ප්‍රකෘතිවලට මුලින් යෙදී ඒවායේ අර්ථයට කිසියම් බලපෑමක් කරන්නේ
    (1) තද්ධිතයි. (2) කෘදන්තයි.
    (3) උපසර්ගයි. (4) නිපාතයි.

23. මේවායින් විරුද්ධාර්ථ පද යුගලයක් නොවන්නේ කුමක් ද?
    (1) ආධුනික - ප්‍රවීණ (2) උත්තම - අධම
    (3) උත්තීර්ණ - සංකීර්ණ (4) ප්‍රාචීන - ප්‍රතිචීන

24. ගංවතුර පාලනය **කිරීම** සඳහා ගඟ දෙපස බැම් **බඳින්න** යැයි කළ යෝජනාව **සම්මත වුවහොත්** ඉන් ජනතාවට සිදුවන සෙත සභාපතිතුමා පැහැදිලි **කළේ ය.**
    ඉහත වාක්‍යයේ ඇති තද කළු අකුරින් මුද්‍රිත ක්‍රියාපද වර්ග පිළිවෙළින් දැක්වෙන පද පේළිය කුමක් ද?
    (1) කෘදන්ත ක්‍රියා, ආවස්ථික ක්‍රියා, අවසාන ක්‍රියා, විධි ක්‍රියා
    (2) අවසාන ක්‍රියා, විධි ක්‍රියා, ආවස්ථික ක්‍රියා, කෘදන්ත ක්‍රියා
    (3) ආවස්ථික ක්‍රියා, කෘදන්ත ක්‍රියා, විධි ක්‍රියා, අවසාන ක්‍රියා
    (4) කෘදන්ත ක්‍රියා, විධි ක්‍රියා, ආවස්ථික ක්‍රියා, අවසාන ක්‍රියා

25. හොඳ කලා **කෘතියක්** කියවන **සහෘදයා** ඉන් අපූර්ව **ආස්වාදයක්** ලබන්නේ ඉන් ලැබෙන **රසඥතාව** නිසා ය.
    ඉහත වාක්‍යයේ ඇති කළු අකුරින් මුද්‍රිත පදවල ශබ්ද ප්‍රකෘති නිවැරදි ව දක්වා ඇති පද පේළිය තෝරන්න.
    (1) කෘතිය, සහෘද, ආස්වාද, රසඥ (2) කෘති, සහෘද, ආස්වාද, රස
    (3) කෘති, සහෘද, ආස්වාද, රසය (4) කෘති, සහෘදයා, ආස්වාදය, රස

- අංක **26** සහ **27** යන එක් එක් ප්‍රශ්න යටතේ දී ඇති ප්‍රස්තාව පිරුළුවලට වඩාත් ගැළපෙන අදහස තෝරන්න.

26. කසළ ගොඩේ තිබුණත් මැණික මැණික ම ය.
    (1) මැණිකේ අගය කසළගොඩේ දී නොදැනේ.
    (2) උතුම් අය පහත් අය ඇසුරු නොකළ යුතු ය.
    (3) උතුම් අය කොතැන සිටියත් පහත් වැඩ නොකරති.
    (4) කොතැන සිටියත් උතුම් අය උතුම් ම ය.

27. කාගෙ කාගෙ කිල්ලෝටෙත් හුනු තිබේ.
    (1) ඕනෑම කෙනෙකුගේ කිල්ලෝටයේ හුනු නැති වන්නේ නැත.
    (2) කවුරුන් තුළ වුවත් වැරදි හා අඩුපාඩු ඇත.
    (3) කවුරුන් වුවත් වැරදි හා අඩුපාඩු හදාගත යුතු ය.
    (4) කවුරුත් තමන්ගේ වැරදිවලට වගකිව යුතු ය.

28. ආබාධිත රණවිරුවන් උදෙසා දානපතිනිය රෝද පුටු කිහිපයක් පරිත්‍යාග කළා ය.
    ඉහත වාක්‍යය කර්මකාරකයට හැරවූ විට නිවැරදි වාක්‍යය වන්නේ මින් කුමක් ද?
    (1) දානපතිනිය විසින් රණවිරුවන් උදෙසා රෝද පුටු කිහිපයක් පරිත්‍යාග කරන ලදි.
    (2) දානපතිනිය විසින් රණවිරුවන් උදෙසා රෝද පුටු කිහිපයක් පරිත්‍යාග කරන ලද්දී ය.
    (3) දානපතිනිය විසින් රණවිරුවෝ උදෙසා රෝද පුටු කිහිපයක් පරිත්‍යාග කරන ලදහ.
    (4) දානපතිනිය විසින් රණවිරුවන් උදෙසා රෝද පුටු කිහිපයක් පරිත්‍යාග කළා ය.

- අංක **29** සහ **30** යටතේ දී ඇති වාක්‍යවලින් ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.

29. (1) නගරවාසීහු විසින් නගරාධිපතිට සන්දේශයක් බාර දුන්හ.
    (2) සාරංගත්, දුලානිත් මමත් විවාද කණ්ඩායමට තෝරා ගන්නා ලද්දෙමු.
    (3) චෛත්‍යයත්, බෝධියත්, බුදුපිළිමයත් බෞද්ධ පූජා වස්තු වෙති.
    (4) ක්‍රීඩකයෝ දිනුම් කණුව කරා ළඟා වෙද්දී ක්‍රීඩා ලෝලීහු අත්පොළසන් දුන්හ.

30. (1) සියලු ඥාතිමිත්‍රාදීන් මේ කනගාටුදායක නිවේදනය පිළිගනිත්වා !
(2) මහානායක හිමි ඊයේ අපවත් වූහ.
(3) ඇමතිතුමා හෝ නියෝජ්‍ය ඇමතිතුමා උත්සවයට සහභාගි වෙති.
(4) නාට්‍යය නැරඹීමට ප්‍රේක්ෂකයන් පැමිණ ඇත.

31. පහත දැක්වෙන වාක්‍යයේ තද කළු අකුරින් මුද්‍රිත වචන හැඳින්වීම සඳහා යෙදෙන ව්‍යාකරණමය අංග පිළිවෙළින් දැක්වෙන පද පේළිය තෝරන්න.

**උපලේකම්** ලවා ලියවන ලද වාර්තාව **ලේකම් විසින්** සභාගත කරන ලද බැවින් **සභාපති සාමාජිකයන්** අමතා එහි ගුණ දොස් ඇත්නම් ඉදිරිපත් කරන ලෙස පැවසී ය.

(1) ප්‍රයෝජක කර්තෘ, අනුක්ත කර්තෘ, උක්ත කර්තෘ, අනුක්ත කර්මය
(2) අනුක්ත කර්තෘ, ප්‍රයෝජක කර්තෘ, උක්ත කර්තෘ, අනුක්ත කර්මය
(3) ප්‍රයෝජක කර්තෘ, උක්ත කර්තෘ, අනුක්ත කර්මය, අනුක්ත කර්තෘ
(4) අනුක්ත කර්තෘ, උක්ත කර්තෘ, ප්‍රයෝජක කර්තෘ, අනුක්ත කර්මය

32. පහත දැක්වෙන වාක්‍යයේ අදහස නිවැරදි ව දැක්වෙන වාක්‍යය තෝරන්න.
"ඒ ගෑනි ඒකිගේ මනුස්සයා එනකන් මෙච්චර වෙලා බලා හිටලා හිටලා ගෙදර පලච්චි"
(1) ඒ ස්ත්‍රිය ඇගේ ස්වාමිපුරුෂයා පැමිණෙන තුරු මෙතෙක් වේලා බලා සිට සිට ඉඳලා ගෙදර ගියා ය.
(2) ඒ ස්ත්‍රිය ඇගේ මනුස්සයා පැමිණෙන තුරු මෙතෙක් වේලා බලා සිට සිට ඉඳලා ගෙදර ගියේ ය.
(3) ඒ ස්ත්‍රිය තමාගේ ස්වාමිපුරුෂයා පැමිණෙන තුරු මෙතෙක් වේලා බලා සිට ගෙදර ගියා ය.
(4) ඒ ස්ත්‍රිය තමාගේ මනුස්සයා පැමිණෙන තුරු මෙතෙක් වේලා බල බලා සිට සිට ඉඳලා ගෙදර ගියා ය.

33. දෙදහස් කල් පැවති **ලබමින්** පාරවටු
නිදහස් ගහේ අතු ඉතිවල **මල්** මොට්ටු
**බිඳ** හිස් කරන වළකනුවට පිටරට්ටු
සිය බස් වැට **බඳිව්** තව තව වී කිට්ටු

ඉහත සඳහන් කවියේ තද කළු අකුරින් මුද්‍රිත ක්‍රියාපද වර්ග පිළිවෙළින් දැක්වෙන පද පේළිය තෝරන්න.
(1) මිශ්‍රක්‍රියා, අපරක්‍රියා, පූර්වක්‍රියා, විධික්‍රියා
(2) අපරක්‍රියා, පූර්වක්‍රියා, විධික්‍රියා, මිශ්‍රක්‍රියා
(3) මිශ්‍රක්‍රියා, පූර්වක්‍රියා, අපරක්‍රියා, විධික්‍රියා
(4) අපරක්‍රියා, විධික්‍රියා, මිශ්‍රක්‍රියා, පූර්වක්‍රියා

34. (*A*), (*B*), (*C*) හා (*D*) පද පේළි කෙරෙහි අවධානය යොමු කරන්න.
(*A*) **මිර** ජලය ඇළ දොළ කඳු පිටින් බට
(*B*) අහෝ බල **බලව** දොස් පුහුදුන්
(*C*) **සුරගුරු** මෙන් පසක්
(*A*) එගුරු **සරණත** නැමදි සිරසින්

ඉහත (*A*), (*B*), (*C*) හා (*D*) පද පේළිවල තද කළු අකුරින් මුද්‍රිත යෙදුම් අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) තද්ධිත, කෘදන්ත, ආඛ්‍යාත, සමාස (2) කෘදන්ත, ආඛ්‍යාත, සමාස, තද්ධිත
(3) කෘදන්ත, තද්ධිත, ආඛ්‍යාත, සමාස (4) ආඛ්‍යාත, කෘදන්ත, සමාස, තද්ධිත

35. එකිනෙකට අනුරූප ලෙස වචන යුගල යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) චංචල නෙත්, ස්වර්ණමය අවධිය, ග්‍රහ ශාන්තිය, නෑ මිතුරු
(2) දාන ශාලාව, පෞද්ගලික පාසල, ලෝ සසුන, පින් කෙත
(3) සිවුසස් දහම්, ක්‍රීඩා බිම, දේව මණ්ඩලය, භූමි ශාස්ත්‍රය
(4) සාහසික ක්‍රියා, ග්‍රහ තාරකා, ප්‍රබල ආයුධය, විදෙස් පුවත්

[ 6 වැනි පිටුව බලන්න.

36. යම් වස්තුවක හෝ පුද්ගලයෙකු වෙත පවතින සැබෑ ස්වභාවය උත්කර්ෂවත් ආකාරයෙන් කරන වර්ණනාව හඳුන්වනු ලබන්නේ කවර නමකින් ද?

(1) උත්ප්‍රේක්ෂාලංකාරය
(2) අතිශයෝක්ත්‍යලංකාරය
(3) උපමාලංකාරය
(4) රූපකාලංකාරය

37. වර්ණිත වස්තුවට හෝ අවස්ථාවට ගැළපෙන සේ ශබ්ද රසය නිර්මාණය කරන්නේ

(1) රිද්මයයි.
(2) එළිසමයයි.
(3) විරිතයි.
(4) අනුප්‍රාසයයි.

38.

**රජකුල සුපුල් විලැ රජ හස වන්** සරන
**පෙර මලවියා වන් රුසිරින් මන** නඳන
හැම කල විපුල සව් සැපතින් නො අඩු වන
**තෙද බල විකුම් ගුණ මිණි බරණින්** තෙවුන

ඉහත පද්‍යයේ තද කළු අකුරින් මුද්‍රිත කාව්‍යෝපක්‍රම හැඳින්වෙන නම් අනුපිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(1) රූපක, උපමා, උපමා, රූපක
(2) රූපක, රූපක, උපමා, උපමා
(3) උපමා, රූපක, රූපක, උපමා
(4) උපමා, උපමා, රූපක, රූපක

39. මුලින් දී ඇති යුගයට ඇතුළත් නොවන ග්‍රන්ථයක් දැක්වෙන වරණය වන්නේ,

(1) දඹදෙණිය යුගය - සද්ධර්මරත්නාවලිය, පූජාවලිය, සිදත් සඟරාව, එළුඅත්තනගලු වංශය
(2) කුරුණෑගල යුගය - පන්සිය පනස් ජාතක පොත, සිංහල ථූපවංශය, සිංහල බෝධිවංශය, අනාගත වංශය
(3) ගම්පොළ යුගය - සද්ධර්මාලංකාරය, ශාසනාවතාරය, තිසර සන්දේශය, මයූර සන්දේශය
(4) කෝට්ටේ යුගය - ලෝවැඩ සඟරාව, පැරකුම්බා සිරිත, බුදුගුණාලංකාරය, කාව්‍යශේඛරය

40. පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන නිවැරදි වාක්‍යය තෝරන්න.

විදේශ ආධිපත්‍යයත්, රටේ අභ්‍යන්තර ව්‍යාකුලතාවත් නිසා මේ රටේ ධර්ම, ශාස්ත්‍ර දෙක බලවත් ආගාධයක තිබූ අවධියේ වැලිවිට අසරණ සරණ සරණංකර සඟරජ මාහිමියන් වහන්සේගේ උත්සාහයෙන් ශාසන පුනරුත්ථානයත්, ශාස්ත්‍රීය පුනර්ජීවයත් උඩරට ප්‍රදේශ කේන්ද්‍රකොට ආරම්භ විය.

(1) විදේශ ආධිපත්‍යයත් රටේ අභ්‍යන්තර ව්‍යාකුලත්වයත් නිසා මේ රටේ ධර්ම, ශාස්ත්‍ර දෙක බලවත් පරිහානියක පැවති යුගයේ වැලිවිට සරණංකර සඟරජ හිමියන්ගේ උත්සාහයෙන් එහි පුනර්ජීවය ලැබීම ආරම්භ වූයේ උඩරටින් ය.
(2) විදේශ ආධිපත්‍යයත් රටේ අභ්‍යන්තර ව්‍යාකුලත්වයත් නිසා උඩරට පරිහානියට පත් ව තිබූ ධර්ම, ශාස්ත්‍ර දෙක වැලිවිට සරණංකර සඟරජ හිමියන්ගේ උත්සාහයෙන් පුනර්ජීවය ලැබීම ආරම්භ විය.
(3) විදේශ ආධිපත්‍යයත්, රටේ අභ්‍යන්තර ව්‍යාකුලත්වයත් නිසා උඩරට සිදු වූ ධර්ම ශාස්ත්‍ර දෙකේ පිරිහීම වළකා පුනර්ජීවය ලැබූයේ වැලිවිට සරණංකර සඟරජ හිමියන්ගේ බලවත් උත්සාහය නිසා ය.
(4) විදේශ ආධිපත්‍යයත් රටේ අභ්‍යන්තර ව්‍යාකුලත්වයත් නිසා පරිහානියට පත් ධර්ම ශාස්ත්‍ර දෙක පුනර්ජීවයට පත් කිරීමට වැලිවිට සරණංකර සඟරජ හිමියන් බලවත් උත්සාහයක් දැරූයේ උඩරට සිට ය.

* *

3294

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

**NEW** **2562 - මූලික පිරිවෙන් අවසාන විභාගය - 2018 දෙසැම්බර්** **01 S I**

(නව නිර්දේශය)

## (01) සිංහල - I පත්‍රය

### II කොටස

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
* මෙම කොටසට නියමිත ලකුණු ගණන **80** කි.

---

**1.** අංක **(i)** සිට **(x)** තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න. *(ලකුණු 02 × 10 = 20 යි)*

(i) පහත සඳහන් ස්වර අක්ෂර දෙකෙන් සෑදෙන සන්ධ්‍යක්ෂර ලියන්න.

(අ) අ + ඉ (ආ) අ + උ

(ii) පහත සඳහන් (අ) සහ (ආ) යටතේ දැක්වෙන අදහස්වලට ගැළපෙන තනිපදය බැගින් ලියන්න.

(අ) ඔටුනු පැළඳවීමේ උත්සවය

(ආ) පර්වතවලින් වටවී ඇති, ප්‍රවේශ වීමට අපහසු ප්‍රදේශය

(iii) පහත සඳහන් පද්‍ය පාඨ දෙකෙහි එන 'කල්' යන්නෙහි අර්ථ දෙක වෙන වෙන ම ලියන්න.

(අ) තුන් කල් බලා රවිඳුට වූ ඉටු මිතුරු

(ආ) බලා සිටු රඟන රඟ මඬලැ කල් බඳ

(iv) (අ) "වෛශේෂික" යන්නෙහි ප්‍රකෘතිය හා තද්ධිත ප්‍රත්‍යය වෙන් කර ලියන්න.

(ආ) ප්‍රදේශ + ඊය ගැළපීමෙන් සෑදෙන තද්ධිත පදය කුමක් ද?

(v) පහත දැක්වෙන පදවලට විරුද්ධාර්ථ පදය බැගින් ලියන්න.

(අ) අල්පේච්ඡතාව (ආ) අත්තුක්කංසනය

(vi) පහත දැක්වෙන පද දෙකේ අනුක්ත රූප ලියන්න.

(අ) නිළියක් (ආ) හෙතෙම

(vii) පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.

සමස්ථ ලංකා පාපැදි තරගයේ විශිෂ්ඨ ශූරතාව දිනා ගන්නා ලද්දේ නාවික හමුදා භටයෙකි.

(viii) පහත දැක්වෙන කර්තෘකාරක වාක්‍යය කර්මකාරකයටත් කර්මකාරක වාක්‍යය කර්තෘකාරකයටත් හරවා ලියන්න.

(අ) මාධ්‍යවේදීහු පාඨකයන් වෙනුවෙන් සත්‍ය තොරතුරු ගවේෂණය කළහ.

(ආ) අංශ ප්‍රධානියා විසින් ලසු ලේඛිකාවක් පත් කරන ලද්දී ය.

(ix) පහත දැක්වෙන යෙදුම්වල පළමු වචනය සහ දෙවන වචනය අතර නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමු වචනය හෝ දෙවන වචනය සකස් කර ලියන්න.

(අ) ප්‍රත්‍යන්ත දනව්ව (ආ) ප්‍රතිමා ගෙය

(x) පහත සඳහන් පද්‍යාර්ධවල තද කළු අකුරින් මුද්‍රිත පද කවර ක්‍රියා වර්ගයට අයත් දැයි දක්වන්න.

(අ) **ලබනුව** සිවු දහන්
පැවිදි කරවා දුන් කමටහන්

(ආ) මැරුව මුනි මහතා
බුදු බව **ලැබෙයි** නියතා

**2.** පහත දැක්වෙන (i), (ii), (iii) හා (iv) යන විස්තර අතුරෙන් එකක් තෝරා ගෙන, වචන **250** කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා, රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න. *(ලකුණු 25 යි)*

(i) පහේ ශිෂ්‍යත්ව විභාගය පිළිබඳ විවිධ මත පළ වේ. එය 'මවුවරුන්ගේ විභාගය' ලෙස ද හැඳින් වේ. මෙම විභාග ක්‍රමය නිසා දරුවන්ට ළමා රසය විඳගැනීමට අවස්ථාව නොලැබීමත් පොතපත කෙරෙහි ම යොමු කරනු ලැබීමත් නිසා ඔවුන්ගේ සමබර පෞරුෂ වර්ධනය කෙරෙහි ද එය අහිතකර ලෙස බලපවත්වන බව කියැවේ. විෂය දැනුමෙන් මෙන් ම ගුණාත්මක භාවයෙන් ද පිරිපුන් අධ්‍යාපනයක් ලබා දීම අධ්‍යාපනයේ පරමාර්ථය විය යුතු ය. මේ අනුව ළමයින්ගේ දැනුම විමසාබැලීම සඳහා ශිෂ්‍යත්ව විභාගය කොතෙක් දුර ප්‍රමාණවත් වේ දැයි සමීක්ෂණය කිරීම කාලීන අවශ්‍යතාවකි.

(ii) කෘෂිකාර්මික කටයුතු විෂයයෙහි රසායනික පොහොර භාවිතය, විෂ රසායනික, පළිබෝධනාශක භාවිතය මෙන් ම පලතුරු ඉදවීම සඳහා විවිධ විෂ රසායන ද්‍රව්‍ය භාවිතය ද නිසා ජනතාවට විවිධ රෝගාබාධවලට මුහුණ දීමට සිදුව තිබේ. එය වාණිජත්වය ඉස්මතු වීමේ හා ස්වාර්ථය පමණක් තකා කටයුතු කිරීමේ අනිවාර්ය ප්‍රතිඵලයකි. මෙබඳු රෝග වළක්වා ගැනීම කෙරෙහි අවධානය යොමු කොට, ආහාර නිෂ්පාදනයේ දී හා කල්තබා ගැනීමේ දී සාම්ප්‍රදායික ක්‍රමෝපාය වෙත අවධානය යොමු කිරීම වැදගත් ය.

(iii) දිනපතා සිදුවන රිය අනතුරු පිළිබඳ ප්‍රවෘත්ති ජනමාධ්‍ය මගින් නිතර අසන්නට දකින්නට ලැබේ. ඒ නිසා සිදු වන ජීවිත හානි හා සදාකාලික ශාරීරික අකර්මණ්‍යතා සංඛ්‍යාව දිනෙන් දින උග්‍ර වන තත්ත්වයක් පවතී. මාර්ග පද්ධතියට ඔරොත්තු නොදෙන තරම් අධික වාහන සංඛ්‍යාව, රියැදුරන්ගේ හා පදිකයන්ගේ නොසැලකිල්ල, මුදල් පසුපස හඹා යාම ආදී මීට බලපාන හේතු රාශියකි. දැඩි නීතිරීති හා දණ්ඩන ක්‍රම කොතෙක් පැවතිය ද දිනපතා සිදුවන අනතුරු සංඛ්‍යාවේ අඩුවක් දක්නට නැත. මේ පිළිබඳ කාගේත් අවධානය යොමු විය යුතු ය.

(iv) ආධ්‍යාත්මික සාරධර්ම පෝෂණය සඳහා කලා රසවින්දනය බෙහෙවින් බලපාන බව අවිවාදයෙන් පිළිගැනෙන්නකි. වර්තමානයේ සමාජය තුළ දක්නට ලැබෙන සාරධර්ම හායනය ජනතාවගේ කලා රසවින්දන ඌනතාවේ ප්‍රතිඵලයකැයි විශ්වාස කළ හැකි ය. පවත්නා ආර්ථික රටාව තුළ ජනතාව මුදල් ඉපයීමට ම කැපවීම, කලාරසවින්දනය සඳහා මිඩංගු කළ හැකි කාලයක් නොමැති වීම, උසස් කලා නිර්මාණ බිහි නොවීම ආදී බොහෝ හේතු මීට බලපා තිබිය හැකි ය. සුඛිත මුදිත ආර්ථික තත්ත්වයක් ගොඩනැඟීම මගින් ජනතාව නැවත මේ සඳහා යොමු කළ හැකි වෙතොත් එය ජාතියේ වාසනාවකි.

**3.** පහත දැක්වෙන පාඨය වචන **50 - 60** අතර වන සේ සාරාංශ කර ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න. *(ලකුණු 10 යි)*

අප අතර පවතින විවිධ වූ භාෂා සමුදායයෙන් එකක හෝ කිහිපයක ප්‍රවීණතාව ලැබීමේ මූලික හැකියාවක් මනුෂ්‍ය සත්ත්වයා ලබා සිටී. එම හැකියාව අන්‍ය සත්ත්වයන්ට නැත. ගිරවුන් මයිනන් වැනි සත්ත්වයන් මනුෂ්‍ය භාෂාවකින් වචන ස්වල්පයක් හෝ වාක්‍ය දෙක තුනක් උගැන්මේ හැකියාව ලබා ඒවා පුනරුච්චාරණය කරන්නට සමත් වුවත් ඒ ප්‍රකාශන අර්ථයක් ඇති ව කරනු ලැබේ දැයි සැක සහිත ය. ඊටත් වඩා වැදගත් වන්නේ තමා උගත් ප්‍රකාශන ස්වල්පය ම පුනරුච්චාරණය කරනු විනා නව ප්‍රකාශනයක් කිරීමේ හැකියාව ඔවුන් සතු නොවීම ය. මනුෂ්‍ය භාෂා ශක්‍යතාවේ මහිමය නම් තමා කිසියම් භාෂාවක ප්‍රවීණත්වය ලැබූ පසු මින් පෙර කිසි දිනක නිර්මාණය නොවූ නව ප්‍රකාශන එම බසින් කිරීමේ හැකියාව මනුෂ්‍යයා සතු වීම ය. අප, වයස එකහමාරේ පමණ සිට ඉගෙන ගෙන වයස පහ, හය පමණ වන විට සම්පූර්ණ කර ගන්නා භාෂා ප්‍රවීණත්වය අනුව පසුව නිපදවන ප්‍රකාශවලින් වැඩි කොටසක් අප මීට පෙර නිර්මාණය නොකරන ලද නව්‍ය වාක්‍ය බව වාග්වේදීන් විසින් පෙන්වා දී තිබේ.

**4.** පහත දැක්වෙන ඡේදය කියවා, අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න. *(ලකුණු 10 යි)*

'කවියට වෙන ම බසක් ඇති ය' යන්න කොයි කවරෙකුට ප්‍රහේලිකාවක් වුව ද සිංහල රසිකයාට ප්‍රහේලිකාවක් විය නොහැකි ය. සියවස් ගණනාවක් ඈතට දිවෙන සිංහල කවිය ඊට විශේෂ වූ වහරක් රැකගෙන ඇති බව අපේ මුළු කාව්‍ය වංශය ම සතු එක් ලක්ෂණයක් විසින් නොමඳ ව පෙන්නුම් කරනු ලැබේ. සිංහල ගද්‍යය බොහෝවිට මිශ්‍ර සිංහලයෙන් ලියැවී ඇති නමුදු සිංහල පද්‍යය හැම කල්හි ම ලියැවී ඇත්තේ හුදු හෙළ වහරිනුයි. පසු කලෙක ලියැවුණු, රාජ සභාවල දී නටා ගයා වයා ඉදිරිපත් කරන ලද ප්‍රශස්ති කාව්‍යවල දී ඇරෙන්නට මිශ්‍ර සිංහලය කිසිවිටක හුදු කාව්‍ය නිර්මාණ සඳහා සිංහල කවීන් යොදා ගෙන නොමැත. අපගේ හද බස වන කවි බස සඳහා මිශ්‍ර සිංහලයෙන් තොර වූ හෙළ බස පමණක් යොදා ගන්නා ලද්දේ කුමක් නිසා ද, මේ ලක්ෂණයට හේතුව කුමක් ද යන්න අප විසින් සොයා බැලිය යුතුයි. මෙහි දී මවිසින් මේ කරුණ ඉදිරිපත් කරන ලද්දේ 'සිංහල කවියට වෙන ම බස් වහරක් ඇති ය' යන්න පෙන්වනු සඳහා මෙය සුගම උදාහරණයක් වන නිසායි.

[ 9 වැනි පිටුව බලන්න.

(i) 'කවියට වෙන ම බසක් ඇත්තේ ය' යන්න සිංහල රසිකයා පිළිගන්නේ ද?

(ii) කාව්‍ය වංශය නොමඳ ව පෙන්නුම් කරන සුවිශේෂ ලක්ෂණය කුමක් ද?

(iii) මිශ්‍ර සිංහලයෙන් ලියැවුණු කාව්‍ය වර්ගය කුමක් ද?

(iv) මෙහි 'හද බස' යන්නෙන් කවියා අදහස් කර ඇත්තේ කුමක් ද?

(v) ප්‍රශස්ති, සුගම යන පදවල අර්ථ පැහැදිලි කරන්න.

**5.** පහත සඳහන් වන්නේ කෑගල්ලේ රන්දුනුගම ශ්‍රී විද්‍යාප්‍රදීප මහ පිරිවෙන ආරම්භ කර 2019.01.10 වෙනි දිනට වසර 50 ක් සම්පූර්ණ වීම නිමිත්තෙන් එම පිරිවෙන් පරිශ්‍රයේ දී 'විද්‍යාප්‍රදීප ස්වර්ණ ජයන්ති උපහාර ප්‍රණාම' උත්සවය හා අධ්‍යාපන ප්‍රදර්ශනය පැවැත්වීම පිළිබඳ පසුගිය දිනක ආදි ශිෂ්‍ය සංගමයේ සාකච්ඡා කොට තීරණය කර ගත් කරුණුවලින් කොටසකි. එම තොරතුරු ආශ්‍රය කොට ගෙන එම උත්සවය පිළිබඳ ප්‍රදේශවාසීන් දැනුවත් කිරීම සඳහා දැන්වීම් පත්‍රිකාවක් පිළියෙල කරන්න. එම තොරතුරු සටහන් කරගෙන ඇත්තේ විද්‍යාප්‍රදීප ආදි ශිෂ්‍ය සංගමයේ ලේකම් මහතා විසිනි.

| | |
|---|---|
| උත්සවය පැවැත්වෙන දිනය | : 2019.01.10 |
| වේලාව | : ප.ව. 1.30 සිට ප.ව. 5.30 දක්වා |
| ස්ථානය | : කෑගල්ල, රන්දුනුගම, ශ්‍රී විද්‍යාප්‍රදීප මහ පිරිවෙන් ප්‍රධාන ශාලාව |
| ප්‍රධානත්වය | : අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යක්ෂ හිමිපාණෝ |
| සහභාගිත්වය | : සබරගමුව පළාත් ප්‍රධාන අමාත්‍යතුමා<br>දිස්ත්‍රික් ලේකම්තුමා<br>පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමා ඇතුළු ගිහි පැවිදි විශාල ප්‍රභූ පිරිසක් |
| විශේෂාංග | : එදින ආරම්භ වන අධ්‍යාපන ප්‍රදර්ශනය විවෘත කරනු ලබන්නේ සබරගමුව පළාත් ප්‍රධාන අමාත්‍යතුමා විසිනි. ප්‍රදර්ශනය 10, 11, 12 යන තෙදින තුළ පැවැත්වීමට නියමිත ය. |

(වචන **100** ක් පමණ තිබීම ප්‍රමාණවත් ය.) *(ලකුණු 15 යි)*

නැතහොත්

කොළඹ 10, මරදාන පිහිටි ග්‍රන්ථ ප්‍රකාශන ආයතනයකට අලෙවි සහායකයන් බඳවා ගැනීම සඳහා පුවත්පත් දැන්වීමක් පළ කළ යුතුව ඇත. එම ආයතනයේ පිරිස් කළමනාකරු ඔබ යැයි සිතා පුවත්පත් දැන්වීමක් පිළියෙල කරන්න. එහි ආයතනයේ නම, බඳවා ගැනීමට නියමිත තනතුර, වයස් සීමාව, අයදුම්කරුගේ නම, ලිපිනය, වයස, දුරකථන අංකය, අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම්, වැටුප, ඉල්ලුම්පත් යැවිය යුතු ක්‍රමය හා අවසාන දිනය, පිරිස් කළමනාකරුගේ ලිපිනය යන කරුණු ඇතුළත් විය යුතු ය. (වචන **100** ක් පමණ තිබීම ප්‍රමාණවත් ය.)

*(ලකුණු 15 යි)*

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි/
முழுப் பதிப்புரிமையுடையது/
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

**NEW** 2562 - මූලික පිරිවෙන් අවසාන විභාගය - 2018 දෙසැම්බර් **01 S II**

(නව නිර්දේශය)

(01) සිංහල - II පත්‍රය

2018.12.19 /12.30 - 14.30 පැ දෙකයි

* 1, 2, 3, 4 යන ප්‍රශ්න සහ 5, 6 හා 7 යන ප්‍රශ්නවලින් එකක් ද තෝරා ගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න. *(ලකුණු 02 × 10 = 20 යි)*

(i) (අ) 'සද්ධර්මරත්නාවලි' යන්නෙහි වචනාර්ථය කුමක් ද?

(ආ) සද්ධර්මරත්නාවලිය රචනා කිරීමේ දී මූලාශ්‍රය කොටගෙන ඇති කෘතිය කුමක් ද?

(ii) (අ) පන්සිය පනස් ජාතක පොත සකස් වීම ආරම්භ වී ඇත්තේ කුමන රජතුමාගේ කාලයේ දී ද?

(ආ) මේ පොතේ දැක්වෙන කතාවල ආකෘතියට අයත් අංග තුන මොනවා ද?

(iii) (අ) සද්ධර්මාලංකාරය කෘතියේ රචකයා කවරෙක් ද?

(ආ) මේ කෘතිය රචනා කිරීමේ අරමුණ කුමක් ද?

(iv) (අ) සැළලිහිණිය හැරුණු කොට කෝට්ටේ යුගයේ රචිත සංදේශ කාව්‍ය දෙකක් නම් කරන්න.

(ආ) සැළලිහිණි සංදේශ ගමන් මාර්ගයේ ආරම්භය හා අවසානය සඳහන් කරන්න.

(v) (අ) රැයිපියෙල් තෙන්නකෝන් කවියා අයත් වන්නේ කොළඹ යුගයේ කුමන කාණ්ඩයට ද?

(ආ) 'ධීවර ගීතය' කවි පෙළේ රචකයා කවරෙක් ද?

(vi) (අ) නිදහස් කවියේ ද්විතීය යුගය නියෝජනය කළ කවියෙකු නම් කරන්න.

(ආ) ඇස්. මහින්ද හිමියන්ගේ කාව්‍ය නිර්මාණයක නම සඳහන් කරන්න.

(vii) පහත සඳහන් කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

ලකල පුළුලුකුල බඳ මිණි මෙවුල්ලා
සමග රන් සලඹ රැවු දී  වෙවුල්ලා

(viii) "ලෙඩට බේත් කොච්චර තිබුණත් කරුමෙට බේත් තියෙනවා යැ?"

(අ) මෙම ප්‍රකාශය හා සබැඳි අවස්ථාව කුමක් ද?

(ආ) මෙම ප්‍රකාශයෙන් අනතුරුව මෙය ශ්‍රවණය කළ තැනැත්තාට ප්‍රකාශකයා දුන් උපදෙස කුමක් ද?

(ix) (අ) 'බැද්දේගම' නව කතාවේ මුල් රචකයා නම් කරන්න.

(ආ) මෙම නවකතාව රචනා වී ඇත්තේ කවර කරුණක් පාදක කරගෙන ද?

(x) (අ) 'දියෙහි ගිලුණු අයියාට' කවි පන්තියේ රචකයා කවරෙක් ද?

(ආ) ගුණදාස අමරසේකර කවියා විසින් රචනා කරන ලද කවි පන්තියක් නම් කරන්න.

[ 2 වැනි පිටුව බලන්න.

**2.** පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා, ඒ එකිනෙකට අදාළ ව (i) සිට (v) තෙක් දී ඇති සියලු ම අනුකොටස්වලට කෙටි පිළිතුරු සපයන්න. *(ලකුණු 04 × 5 = 20 යි)*

(i) එක් කුල දරුවකු සොරකමක දී අල්වාගෙන **පිටි තල** හයා බැඳගෙන සැමිටිවලින් මර-මරා මිනී මරණ තැනට ගෙන යෙති. ඒ සිටු දුවණියෝ ද මහත් වූ කොලාහල නිසා මේ කිම් දෝ හෝ'යි මතු මාලේ සිට බලන්නෝ මරණයට ගෙන යන තැනැත්තවු දැක ඔහු කෙරෙහි පිළිබඳ සිත් ඇතිව උෟම පතා බතුත් නොකා යහනට නැඟිලා වැද හොත්තෝ ය.

(අ) මෙම සිදුවීමෙන් අනතුරුව සිටු දියණිය සිය දෙමවුපියන්ගෙන් ලත් ප්‍රතිචාරය කුමක් ද?

(ආ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(ii) එකල්හි මහාපන්ථක ස්ථවිරයන් වහන්සේ මෙසේ වදාළ සේක. පන්ථකයෙනි, මේ ශාසනයට අයෝග්‍යව සාරමසකින් එක ගාථාවක් වනපොත් කොට ගන්ට අසමර්ථ වූ **ප්‍රව්‍රජ්‍යාකෘත්‍යය** වූ කලී තෙපි කෙසේ **මස්තකප්‍රාප්ත** කරවු දැයි මෙතෙකින් පලා යව යි කියා විහාරයෙන් නෙරපූ සේක.

(අ) මෙම පාඨය හා සම්බන්ධ අවස්ථාව කුමක් ද?

(ආ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(iii) "මේ ගම දැන් හොල්මන් **අඩ්කෝඩ** පිරුණු සතුන් අරක් ගත් **කාලකණ්ණි** ගමකි.' ළමයින් හා මහල්ලන් ද නැසී යන්නාක් මෙන් ගමත් දැන් නැසී යයි.

(අ) මෙම පාඨයට අදාළ අවස්ථා සම්බන්ධය කෙටියෙන් ලියන්න.

(ආ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(iv) ජම්බු ගසට රත     පොරවන්නී
බක් මී ගහ කහ     අන්දන්නී
අඹ දළු ලා රත     තවරන්නී
ලෝ කත විසිතුරු     කැරලන්නී

(අ) මෙම පද්‍යයෙහි ඇතුළත් ධ්වනිතාර්ථවත් යෙදුමක් ලියන්න.

(ආ) මෙම පාඨයෙන් කවියා උද්දීපනය කරනුයේ කුමන අවස්ථාවක් ද?

(v) උදා ගිරි කසුන් රිටි වැට හිස     බැබළී
එදා සහසකර පහනෙ'වි කරත     හෙළී
යොදා නුවන් ඉසුරුට කරන පුද     කෙළී
විදා පියා නිලඹර යන් නොවී     මැළී

(අ) මෙහි ඇතුළත් කාව්‍යෝක්තිය කුමක් ද?

(ආ) කවියා දූතයාට මැළි නොවී පියාසර කරන ලෙස දන්වන්නේ කුමන කරුණක් නිසා ද?

**3.** අම්මා ඔබය කවි පෙළින්

(i) මවකගේ දාරක ප්‍රේමයත්

(ii) නාගරික දිවියේ කටුකත්වයත්

නිරූපිත ය. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

නැතහොත්

බැද්දේගම නවකතාවෙන්

(i) සිළිඳුගේ චරිතය හා

(ii) කරලිනාහාමිගේ චරිතය මගින්

අහිංසක ගැමියන්ගේ නිර්ව්‍යාජ ගතිපැවතුම් නිරූපණය වී ඇති අයුරු එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

*(ලකුණු 15 යි)*

[ 3 වැනි පිටුව බලන්න.

**4.** (i) නන්ද කුමරුගේ චරිතය හා

(ii) කුණ්ඩලකේසිගේ චරිතය ඇසුරෙන්

"කෙළෙස් සතුරා ජයගෙන උතුම් වූ මාර්ගඵල අවබෝධ කර ගත් අයුරු දැක්වීමට සද්ධර්මරත්නාවලි කතුවරයා උත්සුක වී ඇත." එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

**නැතහොත්**

සැළලිහිණි සංදේශ කතුවරයාගේ ප්‍රතිභාපූර්ණ කවිත්වය මතු කෙරෙනුයේ

(ii) අවස්ථා නිරූපණයත්

(iii) උචිත උපමා යොදා ගැනීමත් නිසා ය.

එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

*(ලකුණු 15 යි)*

● **5, 6, 7** ප්‍රශ්නවලින් එකකට පමණක් පිළිතුරු සපයන්න.

**5.** සැදැහැ සිතින් ධර්මශ්‍රවණය කිරීමෙන් ලැබෙන මහත් ඵල මහානිසංස දැක්වීම සද්ධර්මාලංකාර කතුවරයාගේ අභිප්‍රාය විය. නිර්දිෂ්ට කථා වස්තු ඇසුරෙන් උදාහරණ තුනක්වත් දක්වමින් විමසන්න. *(ලකුණු 10 යි)*

**6.** සුලභ අත්දැකීම් පාදක කරගෙන වුව ද ස්වකීය පද්‍ය නිර්මාණ සාර්ථක කර ගැනීමට කොළඹ යුගයේ කවියන් දක්වා ඇති කුසලතාව නිර්දිෂ්ට පද්‍යවලින් උදාහරණ තුනක්වත් දක්වමින් විස්තර කරන්න. *(ලකුණු 10 යි)*

**7.** "අයියනායක කවි පෙළින් ගැමි ජනයාගේ සිතුම් පැතුම් පිළිබඳ ව කවියාගේ උපේක්ෂා සහගත සිතුවිලි නිරූපණය කෙරෙයි." උදාහරණ තුනක්වත් දක්වමින් විමසන්න. *(ලකුණු 10 යි)*

* * *